

සඟ සසුනේ අනාගතය

## ⁜ සමාජ ගැටලු රැසකට විසැඳුම් දෙන දහම් පාසල් අධ්‍යාපනය

– ආචාර්ය තිලෝක සුන්දරී කාරියවසම්

විහාරස්ථානයක් තුළ ආගමික පරිසරයක් ඇසුරු කොටගෙන ලැබෙන දහම් අධ්‍යාපනය නිසා – එසේම, උසස් මට්ටමේ, ඉතා ඵලදායක බෞද්ධ අධ්‍යාපන ක්‍රම නිසා දරුවාගේ මනස තුළ සිදුවන සුවිශේෂ වෙනස – මනෝ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින්.

## ⁜ පියදස්සී මාහිමිට බ්‍රිතාන්‍ය රැජනගෙන් සම්මාන

– ධර්මදූත

බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර කිංග්ස්බරි පාරේ පිහිටි ශ්‍රී සද්ධාතිස්ස ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානාධිපති ගලයායේ පියදස්සි මාහිමියන් වෙත මහා බ්‍රිතාන්‍යයේ දෙවැනි එළිසබෙත් මහ රැජන විසින් 'බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ සම්මාන ලත් සාමාජිකත්වය' පිරිනැමීම නිමිති කරගෙන – උන්වහන්සේගේ ආගමික හා සාමාජික සේවා පිළිබඳ ලියැවුණු ලිපියකි.

## ⁜ ශෝකයට හේතු වන තමන්ගේ වැරැදි

– දිවියාගහ යසස්සී නාහිමි

'සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්' විශේෂාංගය යටතේ ශෝකයට සහ පසුතැවීමට හේතු වන වැරැදි පිළිවෙත් පිළිබඳ විග්‍රහයකි. යම් ක්‍රියාවක් සිදු කිරීමට පෙර එහි ප්‍රතිඵල පිළිබඳ සිතා බැලීමේ වැදගත්කම සහ පිරිහීමට හේතු වන වැරැදි පිළිවෙත් වලින් වැළකී සිටීමේ අවශ්‍යතාව මෙම ලිපියෙන් අවධාරණය කැරේ.

## ⁜ Boudhism and social cervice

**-by Ven. Professor. Bellanwila Wimalaratana Thera**
(Department of Pali and Buddhist Studies - Sri Jayawardanapura University)

## ⁜ බුදු දහමේ පරමාර්ථය නිර්වාණයයි

– මහාචාර්ය හම්මලව සද්ධාතිස්ස නාහිමි

බුදු වදනෙන් අපේක්ෂා කැරෙන මුඛ්‍ය පරමාර්ථය – පුද්ගල සනාතන විමුක්තිය ලෙස එහි දක්වෙන 'නිර්වාණය' බව පෙන්වාදීමට කරන උත්සාහයකි. එසේම නිවන යනු කෙබඳු විමුක්තියක් ද යන්න පාඨකයාට පැහැදිලි කර දීම ද ලේඛකයාගේ අරමුණක් වී ඇති බව පෙනේ.

## ⁜ රිටිගල අරණ

– අනුර කුරුවිටගේ සිල්වා

'වැනසී යන බෞද්ධ උරුම' විශේෂාංගය යටතේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ හා මරදන්කඩවල ප්‍රදේශවලට අයත් සොබා සුන්දරත්වයේ චමත්කාරය දනවන මනරම් කඳුවැටියක් මත පිහිටා ඇති – ක්‍රමයෙන් අභාවයට යමින් පවතින – ඉපැරණි වන අරණක් පිළිබඳ තොරතුරු.

## ⁜ බුදු දහම ලොවට හඳුන්වා දුන් සමාජ සංවර්ධනය

– සරත් බණ්ඩාර කෝණාර

'සමාජ සංවර්ධනය' පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කිරීමට දරන උත්සාහයකි. නූතන ලෝකයේ විවිධ දේශපාලන මත වාද වලට අනුව විග්‍රහ කැරෙන ආර්ථික හා ඒ අනුව වූ භෞතික දියුණුවට පමණක් සීමා වූ අසම්පූර්ණ 'සමාජ සංවර්ධන' සංකල්පය බැහැර කරන බෞද්ධ සමාජ සංවර්ධන උපදේශ.

## ⁜ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි

බුද්ධ ධර්මය සහ ඒ ඇසුරු කොට ගත් විවිධ විෂය කරුණු පිළිබඳ දැනුම පාඨකයාට ලබා දෙන සරල හා කෙටි පිළිතුරු සහිත ප්‍රශ්නෝත්තර ඇතුළත් විශේෂාංගයකි. බුදු දහම ඉගෙන ගන්නා සිසුන්ට මෙන්ම – සාමාන්‍ය පාඨකයාට ද ප්‍රයෝජනවත් විශේෂාංගයකි.

## ⁜ ව්‍යග්ග පජ්ජ සූත්‍රයෙන් හෙළි වන මෙලොව දියුණුවේ මාවත

පුද්ගලයාගේ මෙලොව ජීවිතයේ දියුණුව නැතහොත් ලෞකික දියුණුව සඳහා බුදු මුවෙන් දෙසන ලද ප්‍රගතිශීලී ප්‍රතිපත්ති කිහිපයක් පිළිබඳ විමර්ශනයකි. ආර්ථිකය පිළිබඳ නිවැරැදි ප්‍රතිපත්තිය – මිතුරු ඇසුර පිළිබඳ නිවැරැදි ප්‍රතිපත්තිය සහ උත්සාහය හා ආරක්ෂාව පිළිබඳ නිවැරැදි ප්‍රතිපත්ති කුමක් විය යුතු ද යන්නයි, මෙම ලිපියෙන් පැහැදිලි කැරෙන්නේ.

## ⁜ කොරියාවේ නව බෞද්ධ ප්‍රබෝධයකට ‘වොග්යේ නිකාය’ පියවර ගනී

– ධර්මදූත

මහායාන බෞද්ධ සම්ප්‍රදාය අනුගමනය කරන කොරියාවේ ප්‍රධාන බෞද්ධ නිකාය වන ‘වොග්යේ’ නිකාය මඟින් එරට තුළ සිදු කැරෙන නව ආගමික හා සාමාජික සේවා පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි. ‘එතෙර බොදු පුවත්’ විශේෂාංගය යටතේ මෙම ලිපිය පළ වේ.

## ⁜ රන් වැට හා රන් වියන පිළිසකර කැරේ බුද්ධගයා මහ විහාරයේ පින්කම් රැසක්

‘මෙතෙර බොදු පුවත්’ විශේෂාංගය යටතේ – 1993 වර්ෂයේදී එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපති වශයෙන් කටයුතු කළ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා ඉදිකරවූ රන් වැට ද – වජ්‍රාසනයට සෙවණ පිණිස ඉදිකරවූ රන් වියන ද ශ්‍රී ලංකා රජයේ මූලිකත්වයෙන් සහ පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රහයෙන් නැවත පිළිසකර කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳ ප්‍රවෘත්තියකි.

## ⁜ කම්පා නොවී සිටීම

– උඩුවේ ධම්මාලෝක හිමි

‘දියුණුවේ දොරටු’ විශේෂාංගය යටතේ බුදු දහමේ දැක්වෙන ‘අට ලෝ දහම’ පිළිබඳ අවබෝධයෙන් සිටීමේ වැදගත්කම පැහැදිලි කැරෙන ලිපියකි. ජීවිතයේ යථා තත්ත්වය වූ අට ලෝ දහම නිසි ලෙස වටහාගෙන සිටීමෙන් අනවශ්‍ය මානසික විපර්යාස වලට ලක් නොවී – සුවයෙන්, සතුටෙන් ජීවිතය දියුණුව කරා ගෙන යා හැකි ආකාරය, මෙම ලිපියෙන් පැහැදිලි කැරේ.

## ⁜ ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ ප්‍රකට කරන බෞද්ධ සංඝ සමාජය

– නිර්මලා අමරසිංහ

බෞද්ධ සංඝ සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික සමාජ ලක්ෂණ. ධර්මයම නායකත්වයෙහි තබාගෙන පාලනය වන සුවිශේෂ සමාජ ආයතනයක් වන සංඝ සමාජයෙහි දක්නට ලැබෙන ස්වයං පාලන ප්‍රතිපත්තිය හා ප්‍රජාතන්ත්‍රවාදී අධිකරණ සම්ප්‍රදාය ආදී ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ⁜ සිවු මුනි සාම සෑ රඳුන් ඉදිකැරෙන කිරම වල්ගම් මුල්ලේ සිරි දුමින්දාරාමය

– ආනන්ද අගලකඩ

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල – මිද්දෙණිය අතර වල්ගම්මුල්ල නමැති ගම් පියසේ ප්‍රධාන මාර්ගයට නුදුරුව පිහිටා ඇති තරමක් පැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් දැක්වේ.